# 9 වන පාඩම සම්පූර්ණයෙන්ම.

## 9.1 සංවර්ධනය සඳහා සන්නිවේදනය

සංවර්ධන සංකල්පයේ ආරම්භය හා විකාශය

18 සියවසේ දී යුරෝපයේ සිදුවූ කාර්මික විප්ලවයෙන් පසුව "සංවර්ධනය" යනුවෙන් සංකල්පයක් බිහිවිය. මුල් කාලයේ දී සංවර්ධනය යනුවෙන් හඳුන්වන ලද්දේ රටක ආර්ථික වශයෙන් සිදුවන දියුනුවයි. එයට අමතරව කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන ඉහල නැංවීම හා ඒක පුද්ගල ආදායම ඉහල නැංවීමද සංවර්ධනය යන්නෙන් අදහස් හැඳින්විය.

මෙහිදි සංවර්ධනය යන පර්යාය පදය පිළිබඳව විග්‍රහ කිරිම වැදගත් වේ. ඉංග්‍රීසි භාෂාවෙන් සංවර්ධනය ( development) යන වචනයෙන් පැහැදිලි කරන්නේ "දිග හැරිම" ( unfolding) හා "වර්ධනය" ( growth) යන අර්ථයයි.

එමෙන්ම පවතින තත්ත්වය යහපත් ලෙස වෙනස් කිරිම ( for the betterment of the existing situation) යන්නද සංවර්ධනය යන්නට ලබා දිය හැකි එක් පැහැදිලි කිරිමකි.

මෙහිදි සංවර්ධනය යනු කුමක්ද යන්න පිළිබඳව විවිධ විද්‍යාඥයන් විසින් සිදු කර ඇති පැහැදිලි කිරිම් නිර්වචන ආශ්‍රයෙන් අධ්‍යයනය කිරිම වැදගත් වේ.

- සංවර්ධනය යනු රටක දුප්පත්කම, අසමානතාව විරැකියාව අඩු කිරිම හෝ අහෝසි කිරිමයි - ඩඩ්ලි සියසර් 1969.
- සංවර්ධනය යනු මිනිසුන්ගේ සංවර්ධනය ( මානව සංවර්ධනය) මිස ද්‍රව්‍යමය සංවර්ධනය නොවේ - එඩ්ගා ඕවන්ස් 1987.
- සංවර්ධනය යනු පූර්ණ සමාජ සංවර්ධනයයි. එයට මානසික, අධ්‍යාත්මික සහ ද්‍රව්‍යමය අවශ්‍යතා ඇතුළත් වේ - මහත්මා ගාන්ධි.

18 සියවසේ කාර්මික විප්ලවයෙන් පසුව සංවර්ධනය යන සංකල්පය ගොඩනැගුණු බව ඉහත දී සාකච්ඡා කළෙමු. 18 සියවසේ සිට 1990 දශකය වන තෙක් ආර්ථිකය මත පදනම්ව ලෝකයේ රටවල් ප්‍රධාන කොටස් තුනක් යටතේ වර්ගීකරණය කළ හැකිය.

- පළමුවන ලෝකය
- දෙවන ලෝකය
- තුන්වන ලෝකය.

Udaya Amaraweera, University visiting lecturer,
BA University of J'Pura, MA & M.Phil in
Mass.Com, University of Kelaniya.
Voice: 0711715342

<u>පළමුවන ලෝකය</u>.

පළමු ලෝකය යන්නට ධනේෂ්වර ප්‍රජාතන්ත්‍රවාදි දෘෂ්ටිවාදයට අනුකූල රටවල් අයත්විය. මෙම රටවල් වල දළදේශීය නිෂ්පාදනය සහිත වෙළද ආර්ථිකයක් පැවැතිණ. උදා: ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, කැනඩාව හා බටහිර යුරෝපය.

<u>දෙවන ලෝකය</u>

සෝවියට් සංගමයේ කොමියුනිස්ට් දෘෂ්ටිවාදයට අනුකූල රටවල් මෙයට අයත් විය. මොවුන් කොමියුනිස්ට්වාදි සමාජවාදිහු වුහ. උදා එක්සත් සෝවියට් සමාජවාදි සමුහාණ්ඩුව, චීනය, කියුබාව

මාධ්‍යම සැලසුම් ගත දළ දේශීය නිෂ්පාදනය සහ හොදින් දියුණු කෘෂිකාර්මික ව්‍යුහයක් සහිත ආර්ථිකයක් මෙම රටවල් වලට තිබුණි.

<u>තුන්වන ලෝකය</u>

තුන්වන ලෝකයට අයත් වුයේ ඉහත කදවුරු දෙකටම අයත් නොවු රටවල්ය. විවිධාකාර දේශපාලනමය තත්ත්වයක් ඇති දළ දේශීය නිෂ්පාදිතය අඩු මට්ටමේ හා කාර්මික නොවන ව්‍යුහයක් සහිත ආර්ථිකයක් ඇති රටවල් මෙයට අයත් විය. උදා: අප්‍රිකාව, ඉන්දියානු උපමහද්වීපයට අයත් රටවල්, නැගෙනහිර ආසියාව සවුදි ආරාබිය.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව ලෝකයේ බොහෝ රටවල් ආර්ථික සමාජ සංස්කෘතික වශයෙන් ඉතා පහත් මට්ටමකට ඇද වැටුණි. මේ සමගම සංවර්ධනය යන්න පිළිබදව නැවැතත් කථිකාවක් ලොවපුරා සිදු විය. එමෙන්ම සංවර්ධනය යන්න පිළිබදව වඩාත් පුළුල්ව සාකච්ඡා විය. එමෙන්ම මෙය කොටස් කිහිපයක් යටතේ සාකච්ඡා විය.

- සංවර්ධන සන්නිවේදනය
- සංවර්ධනය හා සන්නිවේදනය
- සංවර්ධනාත්මක සන්නිවේදනය
- සංවර්ධනය සදහා සන්නිවේදනය

**Udaya Amaraweera, University visiting lecturer, BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice: 0711715342**

<u>සංවර්ධන සන්නිවේදනය</u>.

සංවර්ධන සන්නිවේදනය යන්නෙන් අදහස් කරන්නේ රටක "ජාතික සංවර්ධනය" සඳහා ජනමාධ්‍ය ඇතුළු වෙනත් සන්නිවේදන මාර්ග උපයෝගි කර ගැනිමයි. මෙහිදි පුවත්පත්, ගුවන්විදුලි, රූපවාහිනි වැනි සන්නිවේදන පද්ධති මගින් ජනතාව දැනුවත් කිරිම සිදු කරයි. එමෙන්ම ජාතික සංවර්ධනය කොටස් කිහිපයකට බෙදා දැක්විය හැකිය.

- සමාජීය
- සංස්කෘතික
- සදාචාරාත්මක
- ආර්ථික

**Udaya Amaraweera, University visiting lecturer,**
**BA University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

තුන්වන ලෝකයේ රටවලට ජාතික සංවර්ධනයෙහි වැදගත්කම පිළිබඳව විල්බර්ශ්‍රාම් **(Wilbur Schramm)** විසින් පෙන්වා දි තිබේ. ඔහු දක්වා ඇත්තේ තොරතුරු මුලාශ්‍ර විවර කිරිම හා දැනුම ලබා ගැනිමේ මාර්ග හෙළි කිරිම වැදගත් වන බවයි.

සංවර්ධන සන්නිවේදනයට අයත් කාර්යයන් පිළිබඳව විමසිම වැදගත් වේ. එවැනි කාර්යයන් කිහිපයක් හඳුනාගත හැකිය. එනම්

- තොරතුරු ව්‍යාප්ත කිරිම
- අධ්‍යාපනය
- සමාජ අළෙවිකරණය
- සමාජ ප්‍රවර්ධනය
- මාධ්‍ය ප්‍රවර්ධනය
- සමාජීය සංවර්ධනය

සංවර්ධන සන්නිවේදනය හඳුන්වා දුන් මුල් යුගයේ දි සිදුවුයේ බටහිර විද්‍යාඥයින් පිළිගනු ලැබු ඉහල සිට පහලට වු ධුරාවලිය **( Top down hierarchy)** ක්‍රියාත්මක කිරිමයි.

කෙසේ වෙතත් පසුකාලිනව මෙම සංකල්පය ක්‍රියාත්මක කිරිමේ දි තුන්වන ලෝකයේ රටවල විවිධ ව්‍යාකුල තත්ත්ව ඇති විය. විශේෂයෙන්ම එම රටවල ධන සම්පත් සූරාකෑම, සමාජ අසමතාවය වැඩි විම, මිලටරිවාදය, පාරිසරික හානිය වර්ධනය විමට හේතුවිය. එමෙන්ම 1960 දි මෙම සංකල්පය ඔස්සේ ලතින් ඇමෙරිකාව නවිකරණය කිරිමට වැඩසටහන් රාශියක් හඳුන්වා දුන්නේය. නමුත් ඒවාද අසාර්ථක විය.

ඒ අනුව මෙම සංකල්පය විද්වතුන්ගේ විවේචනයට ලක්වුන අතර එතුලින් තුන්වන ලෝකයේ රටලට මෙය ප්‍රයෝජනවත් නොවන බව විද්වතුන් පෙන්වා දුන්නේය.

තුන්වන ලෝකයේ රටවලට සංවර්ධනය කරා ගමන් කිරිමට තමන්ගේම මාවතක් අවශ්‍ය බව විද්වතුන් විසින් පෙන්වා දුනි එහි ප්‍රතිඵලයක් වශයෙන්" සංවර්ධනය සඳහා සන්නිවේදනය" යන සංකල්පය හඳුන්වා දුන්නේය.

<u>සංවර්ධනය සදහා සන්නිවේදනය</u>

සංවර්ධනය සදහා සන්නිවේදනය යනු තිරසර ප්‍රජාතාන්ත්‍රික සංවර්ධනයට අදාලව සමාජයේ සිදු විය යුතු සියලු ආකාරයේ සන්නිවේදනය වෙත යොමු වන පුළුල් අර්ථයක් සහිත යෙදුමකි.

මෙහිදි සංවර්ධනය සදහා සන්නිවේදනය පිළිබඳව විවිධ ක්ෂේත්‍රවල විද්වතුන් විසින් සිදු කර ඇති පැහැදිලි කිරිම් පිළිබදව අවධානය යොමු කිරිම වැදගත් වේ.

එක්සත් ජාතින්ගේ මහා මණ්ඩලය 1996 දි දක්වා ඇති විග්‍රහය වන්නේ

"සංවර්ධනය සදහා සන්නිවේදනය යනු සංවාදය සක්‍රිය කරවන, ද්විමාර්ග සන්නිවේදන පද්ධති මගින් ප්‍රජාවන්ට ඔවුන්ගේ අභිලාෂ හා උත්සුක ප්‍රකාශ කිරිමට හැකි හා ඔවුන්ගේම සංවර්ධන ක්‍රියාවලියක අදාළ තීරණ වලට සහභාගීව මැදිහත් විමයි".

සංවර්ධනය සදහා සන්නිවේදනය පිළිබදව රෝම සම්මුතිය 2006 දි දක්වා ඇත්තේ

"සංවර්ධනය සදහා සන්නිවේදනය යනු පුළුල් පරාසයක මෙවලම් හා ක්‍රම භාවිතා කරමින් සංවාදය මත පදනම් වු සමාජ ක්‍රියාවලියකි. එසේම දැනුම නිපුණතා බෙදාහදා ගැනිම ගොඩනැගිම මෙන්ම ප්‍රතිපත්ති විවාද සහ ස්ථිරසාර වු සංවර්ධනයක් සදහා සවන්දිම විශ්වාසය ගොඩනැගිම හා විවිධ මට්ටම්වල වෙනස්කම් හදුනා ගැනිමයි. එය මහජන සම්බන්ධතාව හෝ ආයතනික සන්නිවේදනය නොවේ"

**Udaya Amaraweera, University visiting lecturer,**
**BA University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

**සිල්වියෝ වයිස්බෝඩ්(Silvio waisboard) සංවර්ධනය සඳහා සන්නිවේදනයේ ප්‍රායෝගිකභාවය පිළිබඳව අදහස් පහක් දක්වා තිබේ.**

- **කේන්ද්‍රගත බලය ශක්තිමත් කිරිම ( පුද්ගලයන් හා ප්‍රජාවන් දැනුම අත්පත් කර ගැනිම හා ගැටලු සම්පාදනය කිරිම).**
- **ඉහළ පහළ හා පහළ ප්‍රවේශ ඒකාබද්ධ කිරිම.**
- **සන්නිවේදන මෙවලම් භාවිතා කිරිම**
- **පුද්ගලාන්තර සන්නිවේදනය හා ජන සන්නිවේදනය අතර සමබරතාව නිර්මාණය කිරිම.**
- **පුද්ගල හා සමාජ හැසිරිම් වෙනස් කිරිමේ වැඩසටහන් වලට පුමුඛතාව ලබා දිම.**

**ශ්‍රීනිවාස් මෙල්කොට්(Srinivas Melkote) සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳව පහත කරුණු දක්වා ඇත.**

- **විචාරාත්මක සිද්ධාන්ත මගින් මානව සමාජ ගැටලුවලට විසඳුම් සැපයීම.**
- **මිනිසාගේ ඉතිහාසය ක්‍රියාවලියක් බව වටහා ගැනිම**
- **ආගමික බැදිම්වලින් තුන්වන ලෝකයේ විමුක්තිය ලබා ගැනිම**
- **සන්නිවේදනය සහ ව්‍යුහය පිළිබඳව සම්බන්ධතා වැඩි දියුණු කිරිම**
- **තුන්වන ලෝකයේ සංවර්ධනය සඳහා සන්නිවේදනය වැඩි දියුණු කර ගැනිම පිණිස වූ යෝජනා හා ඒවා සිදු කළ හැක්කේ කෙසේද යන්න යාන්ත්‍රික ප්‍රශ්න ඇසුරින් පමණක් අවශ්‍යතා තහවුරු කර ගත නොහැක.**

**ස්විඩනයේ මැල්මො විශ්වවිද්‍යාලයේ සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳව පහත පරිදි නිර්වචනයක් ඉදිරිපත් කර ඇත.**

**‘‘ගෝලියකරණ සන්දර්භයෙහි සංවර්ධනය සඳහා සන්නිවේදන භාවිතය යනු සමාජ වෙනස්කම් සඳහා ක්‍රියාවලි ප්‍රකාශයට පත් කිරිමේ ක්‍රියාවලියකි’’.**

**Udaya Amaraweera, University visiting lecturer,**
**BA University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>සංවර්ධන සංකල්පයේ ආරම්භය හා විකාශය</u>

සංවර්ධන සංකල්පය සංවර්ධනය වන රටවල සුවිශේෂී සමාජ, ආර්ථික, සංස්කෘතික ලක්ෂණ සැලකිල්ලට ගනිමින් ගොඩනගන ලද්දකි. මෙහි මූලික අරමුණ නම් සංවර්ධනය වන රටවල දුගිභාවය දුරලීම, සහයෝගිතාවය වර්ධනය කිරිම, ජාතික සංවර්ධනය වර්ධනය කිරිමයි.

සංවර්ධනය වන හා දුප්පත් රටවල ක්‍රියාත්මක කරන ලද විවිධ සංවර්ධන ක්‍රමවේද හරහා එම රටවල් තව දුරටත් දරිද්‍රතාවයේ ගිලියැමත්, ජාතික ඒකාබද්දතාවය ගිලිහි යැමත් සිදුවිය. එම නිසා එම රටවල් වලට උචිත සංවර්ධන සංකල්පයක් හදුන්වාදිමට ගත් ක්‍රියාමාර්ගයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම සංකල්පය බිහිවිය.

මෙම සංකල්පය මගින් මූලිකවම සිදු කරන්නේ රටක ආර්ථික, කෘෂිකාර්මික වැනි ක්ෂේත්‍ර දියුනු කිරිම පමණක්ම නොවේ. එයට අමතරව ප්‍රජාවගේ රුචිකත්වය, රසවින්දනය, විවේකය පුද්ගල නිදහස, අධ්‍යාත්මික ගුණභාවය වර්ධනය කිරිමයි.

මෙම සංකල්පය ක්‍රියාත්මක කිරිමේ දි අතිශය නූතන සන්නිවේදන ක්‍රමවේද මෙන්ම සාම්ප්‍රදායික වාචික, ආවාචික සන්නිවේදන ක්‍රමවේද, අන්තර් පුද්ගල, සමුහ වැනි සන්නිවේදන ක්‍රමවේදයන් ද යොදා ගනු ලැබේ.

මෙම සංකල්පයේ නව ප්‍රවණතාවයක් වශයෙන් සංවර්ධනය සදහා සන්නිවේදනය හැදන් විය හැකිය.

<u>සංවර්ධනය සංකල්පය පිළිබද මතවාද.</u>

යුරෝපයේ සහ බටහිර රටවලට අවශ්‍ය වන පරිදි ලෝකයේ අනෙකුත් රටවල ආර්ථිකය පරිවර්තනය කර ගැනිම සදහා භාවිතා කරන අධිපත්‍යයේ උපකරණයක් ලෙස මෙය හැදින්විය හැකිය. තෙවන ලෝකයේ රටවල සංවර්ධනය සදහා අනුගමණය කරන ක්‍රමවේද අසාර්ථක වි ඇත. බොහෝ රටවල් තමන් සතුව ඇති සම්පත් පිළිබදව තැකිමක් නොමැතිව ඒවා සංවර්ධන කටයුතු වලට යොදවයි.

<u>සංවර්ධන සංකල්පයේ නව ප්‍රවණතා</u>

Udaya Amaraweera, University visiting lecturer,
BA University of J'Pura, MA & M.Phil in
Mass.Com, University of Kelaniya.
Voice: 0711715342

<u>මුල් යුගය</u>

**1950 – 1970**

ඇමෙරිකානු සමාජ විද්‍යාඥයන් සංවර්ධන සන්නිවේදනය විද්‍යාත්මක සංකල්පයක් ලෙස හැදින්විය. ඔවුන් නවිකරණ න්‍යාය නමින් ක්‍රමවේදයක් හදුන්වා දුනි. එම න්‍යායෙන් ඉහළ සිට පහළට සන්නිවේදන ප්‍රවේශය යන ක්‍රමවේදය විස්තර කරයි.

<u>නවීකරණ න්‍යාය</u>

මෙමගින් දියුණු රටවල් නූතනත්වයට පත් නොවන්නේ මන්ද යන්න මත දරිද්‍රතාවයට විසඳුමක් ලෙස ධනේෂ්වර සාරධර්ම ව්‍යාප්ත කිරිම මගින් කොමියුනිස්ට් වාදයේ ව්‍යාප්තිය අඩු කිරිමට යෝජනා කරන ලදි.

<u>පරායත්තතා න්‍යාය( Dependency Theory)</u>

1950 දි ලතින් ඇමෙරිකාව සහ කැරිබියන් සඳහා වන ආර්ථික කොමිසම මෙම න්‍යාය හඳුන්වා දුනි. (The Economic Commission for Latin America and the Caribbean – ECLAC) දියුණු රටවල්වල ආර්ථිකය මත යැපිමෙන් නොදියුණු රටවල් සංවර්ධනය කර ගත හැකි බව මෙමගින් පවසයි.

එවරට් රොජර්ස්( Everett Roger – 1931 – 2004) විසින් 1962 දි නවෝත්පාදන විසිරණය හඳුන්වා දුන්නේය. මෙම න්‍යායෙන් නව අදහස් හා තාක්ෂණික ව්‍යාප්තිය කෙසේද? කවර කරුණක් සඳහා ද? කුමණ වේගයකට අනුවද? යනාදිය අවබෝධ කර ගැනිමට වැදගත් න්‍යායකි. සංවර්ධන සංකල්පය ජනගත කිරිම සඳහා රොජර්ස් නවිකරණය සන්නිවේදන නාලිකා කාලය හා සමාජ පද්ධති පිළිබඳව අවධානය යොමු කළ යුතු බව දක්වයි.

නව විශ්ව තොරතුරු හා සන්නිවේදන ප්‍රඥප්තිය( New World Information and Communication order – NWICO) විසින් “සංවර්ධනය සඳහා සන්නිවේදනය” යන්න ප්‍රධාන බලවේගයක් බවට පත් කරන ලදි. එමගින් පැරණි “සංවර්ධන සන්නිවේදනය” විවේචනයට ලක් කරමින් සංවර්ධනය සඳහා විකල්ප ප්‍රවේශ සොයා ගැනිණි. බලය හා සංස්කෘතිය යන සාධක දෙක සංවර්ධනය සඳහා සන්නිවේදනයට එකතුවිය.

වර්තමානයේ දි පුද්ගලාන්තර සන්නිවේදනය, ප්‍රායෝගිකත්වය, සහභාගිත්වය හා දැනුම් හුවමාරුව යනාදිය කෙරෙහි අවධානය යොමු කොට තිබේ.

තොරතුරු ප්‍රවේශය, දැනුමට විවෘත ප්‍රවේශය, උපාය මාර්ගික සන්නිවේදනය, සහභාගිත්ව සන්නිවේදනය, සංස්කෘතිය, මාධ්‍ය, තොරතුරු, සන්නිවේදන යටිතල පහසුකම් සහ තාක්ෂණය ආදි ක්ෂේත්‍රබල ගැන්විම මේ ක්‍රියාවලියේ දි වැදගත් කොට සලකන ලදි.

ද්විමාර්ගික සන්නිවේදකයා, තිරස් සන්නිවේදනය මාර්ග, මහජන සවන්දිම්, විවාද, සාකච්ඡා, පර්ශ්වකරුවන්ගේ උපදේශන, සහභාගිත්ව ගුවන්විදුලි හා විඩියෝ වැඩසටහන් ප්‍රජාපාදක නාට්‍ය හා කථා වෙබ්සංසද මෙයට ඇතුලත් වේ.

**Udaya Amaraweera, University visiting lecturer,**
**BA University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

ස්ථිරසාර සංවර්ධනය සඳහා සන්නිවේදනය( **communication for sustainable development – C4SD)** සංවර්ධනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය( **Information and Communication Technology for Development – ICT4D)** යනාදිය සංවර්ධනය සඳහා සන්නිවේදනයේ පුළුල් කොටසක් බවට පත්විය.

මෙලෙසින් "සංවර්ධන සන්නිවේදනය" යන මතවාදය "සංවර්ධනය සඳහා සන්නිවේදනය" ලෙස විතැන් විය. එමගින් "සංවර්ධනය" යන්නට සේම "සන්නිවේදනය" යන්නට ද ප්‍රමුඛත්වයක් ලැබිණි.

සංවර්ධනය සඳහා සන්නිවේදනය යනු ක්‍රියාකාරකම් මගින් සංවර්ධන ප්‍රතිපත්තිවලට හා ක්‍රියාදාම වලට අනුකූලව ග්‍රාමීය ජනතාවගේ තොරතුරු ලබා ගැනීම සහ සුදුසු ක්‍රමවේද නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම මගින් සමාජීය සංවාද දිරි ගැන්වීමයි.

**Udaya Amaraweera, University visiting lecturer, BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice: 0711715342**

## 9.2 සංවර්ධන සංකල්පයේ නූතන ස්වභාවය.

වත්මන් සංවර්ධන සංකල්පය "සංවර්ධනය සඳහා සන්නිවේදනය" මත පදනම් වේ. නූතනයේ සංවර්ධනය සඳහා සන්නිවේදනය( **Communication for Development – C4D)** ඉතා පැහැදිලිවම ජනතාව බලගැන්වීම සඳහා යොදා ගනු ලැබේ. මෙම සංකල්පය වසර 50කට වැඩි කාලයක් මුළුල්ලේ නවීකරණය හා කාර්මීකරණය සමග සංවර්ධන ක්‍රියාවලියේ සුවිශේෂ උපක්ෂේත්‍රයක් ලෙස වැඩුනකි. භූගෝලීය, සංස්කෘතික, සමාජීය සහ ආර්ථික සන්දර්භවල විවිධාකාර දිශා ඔස්සේ සංවර්ධනය උදෙසා සන්නිවේදනය පුළුල් ලෙ භාවිතා කිරීම මෙම සංකල්පයේ මූඛ්‍ය අරමුණ වේ.

එක්සත් ජාතින්ගේ සහශ්‍රක සංවර්ධන ඉලක්කයන් මගින් ගෝලීය සංවර්ධන ගැටලු කෙරෙහි අලුත් මාන වර්ධනය වන ක්‍රමවේද හා නව සන්නිවේදන ප්‍රවේශ වැඩි දියුණු කිරීම සඳහා අවස්ථාවක් සපයයි.

එක්සත් ජාතින්ගේ සංවිධානය අන්තර් සම්බන්ධිත සංවර්ධනය සඳහා සන්නිවේදන ප්‍රවේශ හතරක් ප්‍රකාශ කරයි.

- හැසිරීම් වෙනස්කම් සඳහා සන්නිවේදනය **( Communication for behavior change)**
- සමාජීය වෙනස්කම් සඳහා සන්නිවේදනය**( Communication for social change)**
- නියාමනය සඳහා සන්නිවේදනය**( Communication for regulation)**
- පාරිසරික සමතුලිතතාව සඳහා සන්නිවේදනය **( Communication for ecological balance)**

මෙම සංකල්පය මානවයාගේ පූර්ණ සංවර්ධනය සඳහා අවධානය යොමු කරන අංගයකි. එමෙන්ම මානවයාගේ ආර්ථික සංවර්ධනය පමණක්ම නොව ඔහුගේ සමාජ, සංස්කෘතික, ආකල්පමය සංවර්ධනය සඳහා අවධානය යොමු කරයි. පහතින් දැක්වෙන්නේ සංවර්ධනය සඳහා සන්නිවේදනයට සංකල්පයට අයත් වැදගත් මාතෘකා කිහිපයකි.

- ජනතා කේන්ද්‍රියතාව
- ප්‍රාදේශියකරණය
- සමාජීය සම්බන්ධතා හා සමානාත්මතා ගොඩනැගිම
- දරිද්‍රතාව අවම කිරිම
- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජනතා මැදිහත්විම.

Udaya Amaraweera,
University visiting lecturer,
BA University of J'Pura, MA &
M.Phil in Mass.Com,
University of Kelaniya.
Voice: 0711715342

ජනතා කේන්ද්‍රියතාව

සංවර්ධනය සන්නිවේදන සංකල්පය ව්‍යවහාරයට යොමු වු මුල් කාලයේ දි ඊට මැදිහත් වු බටහිර සමාජය විසින් එය ක්‍රියාත්මක කරන ලද්දේ ඉහළ සිට පහළට ගලා යන ඒකමාර්ගික සන්නිවේදන ක්‍රියාවක් ලෙසයි. එයට හේතුවුයේ තුන්වන ලෝකයේ ජනතාව අනුවන පුද්ගලයන් ලෙස සැලකිමයි. සන්නිවේදන සන්දේශ සම්ප්‍රේෂණය කිරිම සඳහා ෂැනන් හා විවර්සන්නිවේදන ආකෘතිය යොදා ගත්තේය. නමුත් පසු කාලයේ දි මෙයට වඩා ඵලදායක ලෙස විල්බර්ශ්‍රාම් විසින් ග්‍රාහක අත්දැකිම් පසුතලය යොදා ගත්තේය.

මෙහිදි සකස් කිරිමේ දි නොවසේනම් ප්‍රජාව ඉලක්ක කර ගත් සංවර්ධන වැඩසටහන් සකස් කිරිමේ දි ජනතාවගේ සිතුම් පැතුම් ආකල්ප ජිවන රටාවන් දැනුම සැලැකිල්ලට ගත්තේය. මේ හරහා ද්විමාර්ගික සන්නිවේදනයක් ගොඩ නැගුණි.

සංවර්ධනය සඳහා ජනතාව මුලික කර ගත් ඒකාබද්ධ මුලෝපායික ප්‍රවේශ හඳුනා ගැනිමේ ක්‍රියාවලිය යනුවෙන් ජනතා කේන්ද්‍රිය බව දැක්විය හැකිය.

ජනතා කෙන්ද්‍රිය යනු පුරවැසියෙකුටම තම සියලු අවශ්‍යතා වෙනුවෙන් අදහස් දැක්විමට ලැබෙන අවස්ථාවකි. එනම් පුද්ගලයන්ගේ නිපුණතා යහපැවැත්ම උදෙසා ශත්තිමත් කිරිමයි.

ජනතා කේන්ද්‍රිය රැකවරණයට පුද්ගල කෙන්ද්‍රිය රැකවරණය ද ඇතුලත් වේ.

මෙහිදි එම සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ සෑම පුද්ගලයකුටම සංවර්ධන සංවර්ධන වැඩසටහනට සක්‍රියව දායකවිමේ හැකියාව ඇත.

ජනතා කේන්ද්‍රිය සන්නිවේදනය මුලධර්ම කිහිපයක් ඔස්සේ විග්‍රහ කළ හැකිය.

- මෙහිදි පුද්ගල යහපැවැත්ම පුද්ගල රැකවරණය කෙරෙහි අවධානය යොමු කරයි.
- හවුල්කාරිත්වය හා සහභාගිත්වය මුඛ්‍ය වේ.

- සමාජ / සංස්කෘතික විවිධත්වය පිළිබදව අවධානය යොමු කරයි.
- මාධ්‍ය පරිශීලකයන් අතර සම්බන්ධතාව සහ සන්නිවේදනයේ ගුණාත්මකභාවය.
- පුද්ගල අවශ්‍යතා සදහා ප්‍රතිචාරාත්මක රැකවරණය
- අඛණ්ඩ පෞද්ගලික සම්බන්ධතා
- අයිතින් සහ වගකීම්

**Udaya Amaraweera, University visiting lecturer, BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice: 0711715342**

<u>ප්‍රාදේශියකරණය</u>

ප්‍රාදේශියකරණය යනු සංවර්ධනය ඒ ඒ රටවලට ගැළපෙන ලෙස ඒ ඒ රටවලම සිදු කර ගැනීමයි.

මෙහිලා ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී දරිද්‍රතාව අවම කිරීම සහ ආර්ථික වර්ධනය පිළිබද ගැටලු විසදීම පිළිබද මතවාදය ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට ගනියි.

මෙහිදි භූමි හායනය සහ කාන්තාරකරණයෙන් වැළකීම, වනාන්තර ආරක්ෂා කිරීම, ජල සම්පත් කළමනාකරණය සහ ජෛව විවිධත්වය සුරකීම වැනි කාර්යය සදහා ග්‍රාමීය ජනතාවගේ සහභාගිත්වය ලබා ගැනීම සිදු වේ.

මෙහිදි එක් එක් රටවල සමාජ ආර්ථික සංස්කෘතික ලක්ෂණ සැලකිල්ලට ගනිමින් එයට ගැලපෙන ආකාරයට සංවර්ධන සැලසුම් ඔවුන් විසින්ම සකස් කර ගනියි. මේ සදහා ප්‍රජා ගුවන් විදුලි සේවාවන්, ප්‍රාදේශිය පුවත්පත් යොදා ගත හැකිය.

ශ්‍රී ලංකාවේ මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී යොදා ගත් ප්‍රාදේශිය ගුවන් විදුලි සේවා වශයෙන් රජරට සේවය, රුහුණු සේවය, මහනුවර සේවය, කොත්මලේ එෆ්එම් දැක්විය හැකිය.

<u>සමාජීය සම්බන්ධතා සහ සමානාත්මතා ගොඩනැගීම.</u>

මෙහිදි සමාජීය සම්බන්ධතා යන්නෙන් අදහස් කරන්නේ තමන්ගේම සමාජ ක්‍රියාවක් නිර්මාණය කිරීම මගින් අන්අයගේ ක්‍රියා වටහා ගැනීම, අන්තර්ක්‍රියා සම්බන්ධිකරණය, තමන්ගේම ඇගැයුම් සහන සැලසීම අර්ථවත් අභිප්‍රේරණය යනුවෙන් අදහස් වේ.

සමානාත්මතාව යන්නෙන් අදහස්වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ කුලුණයි. 18වන සියවසේ ප්‍රංශ විප්ලවය හා ඇමෙරිකානු නිදහස් සටනේ දි මෙම සංකල්පය ඉදිරියට පැමිණ තිබේ.

මෙමගින් විශේෂයෙන්ම සමාජයේ පුළුල් වෙනස්කම් ඉවත්කිරීම, විශේෂ වරප්‍රසාද අවසන් කිරීම, හැකියා පදනම මත සමාන අවස්ථා ලබාදීම සහ පුද්ගලයන්ගේ මූලික අවශ්‍යතා සපුරා ලීම සදහා විධිවිධාන සැලසීමයි.


සමාජීය සම්බන්ධතා හා සමානාත්මතා ලක්ෂණ

- විශේෂිත මානව අයිතිවාසිකම් නොමැතිවීම
- සංවර්ධනය සඳහා සමාන අවස්ථා පැවැතීම
- අවම අවශ්‍යතා සම්පූර්ණ කිරීම
- පන්ති භේදය තුරන් කිරීම
- සාධාරණ හේතු මත වෙනස්කම් කිරීම.

**Udaya Amaraweera, University visiting lecturer, BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>දරිද්‍රතාවය අවම කිරීම</u>

දරිද්‍රතාවය යනු ධනය අඩුවීම පමණක්ම නොවේ. එය අහිමි වීම් රැසක එකතුවකි. එසේම දිගු කාලයක් දරිද්‍රතාවය තුළ දිවිගෙවීම නිසා එය ඇබ්බැහි වූ ජීවන රටාවක් බවට පත්වේ. මෙය දුගීභවේ විෂම චක්‍රය යනුවෙන් හඳුන්වනු ලැබේ. දුගීභවේ විෂම චක්‍රය කොටස් කිහිපයක් යටතේ විග්‍රහ කළ හැකිය.




දුගීබවේ විෂම චක්‍රයෙන් ජනතාව මුදවා ගැනීම සඳහා ද්‍රව්‍යමය ආධාර ලබාදීම ඵල රහිත වන අතර මානව ශක්තීන් හා විභවයන් ඉස්මතු කිරීම හා බල ගැන්විය යුතුය. මෙහිදි ද්විමාර්ගික බහුමාර්ගික සන්නිවේදන ක්‍රම භාවිතා කිරීම වැදගත් වේ.

<u>දරිද්‍රතාවය පිටු දැකීම සඳහා පහත ක්‍රමවේද අනුගමණය කිරීම වැදගත්වේ.</u>

- ස්ථරසාර ජීවනෝපාය ව්‍යවසායික අවස්ථා සහ ඵලදායි සම්පත් සඳහා ප්‍රවේශය දියුණු කිරීම.
- මූලික සමාජ සේවාවලට විශ්විය ප්‍රවේශ සැපයීම.
- තමන්ගේම ශක්තියෙන් නැගී සිටිය නොහැකි අයට උපකාර කිරීම සඳහා ප්‍රවේශ වැඩි දියුණු කිරීම.
- දරිද්‍රතාවයෙන් ජීවත්වන ජනතාව සහ ඔවුන්ගේ සංවිධාන බල ගැන්වීම.

- දරිද්‍රතාවේ අසමානතා වල බලපෑමට ගොදුරුවන කාන්තාවන්ට විසඳුම් ලබාදීම.

- දරිද්‍රතාව පිටු දැකිමට සංවර්ධනය සඳහා සන්නිවේදනයේ වැඩි කොටසක් වෙන් කිරිම සහ ඒ සඳහා ජාත්‍යන්තර සහයෝගය ශක්තිමත් කිරිම.

<u>ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජනතා මැදිහත්විම.</u>

මෙමගින් අපේක්ෂා කරන්නේ ජනතාවගේ සැබෑ ප්‍රශ්න ජනතාව තුළින්ම හඳුනාගෙන ඒවා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පදනම් කර ගැනිමයි. මෙහිදි එක් එක් පුද්ගලයාගේ ගැටලුව පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබා සහභාගි වන්නන්ගේ, ගැටලු ඔවුන් ඉදිරිපත් කරන කරුණු, අද්දැකිම්, දැනුම, අදහස්, මනාප, අපේක්ෂා, භිති සහ වටිනාකම් හුවමාරු කර ගැනිමට සහභාගිවන්නන්ට අවස්ථාව සලසනු ලැබේ. එලෙස සහභාගිත්වය ලබා දිම මගින් ප්‍රතිපත්ති සම්පාදනයට ප්‍රජාවට ම මැදිහත් විය හැකිය. මේ සඳහා අන්තර් පුද්ගල සහ සමුහ සන්නිවේදන ක්‍රම උපයෝගි කර ගනු ලැබේ. මෙම ක්‍රමවේදයේ දි ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සෘජුවම ජනතා සහභාගීත්වය ලබා ගනු ලැබේ. ඒ සඳහා,

- රාජ්‍ය හිමිකාරිත්ව මාධ්‍ය වෙනුවට වඩාත් ම ඵලදායි මාධ්‍ය යොදා ගැනිම.
- ධනවාදයේ සහ වැඩවසම්වාදයේ බාධක ඉවත් කිරිම මගින් සම්පත් මහජන අයිතිය වෙනුවෙන් උපයෝගි කර ගැනිම.

- පොදු මිනිසාගේ මුලික අවශ්‍යතා හා බැදි මහා පරිමාන නිෂ්පාදනය සඳහා සැලසුම් කිරිම.
- ආර්ථික වශයෙන් පසුගාමි රටවල ආර්ථික සංවර්ධනය සිදු කළ හැක්කේ විකල්පයකින් නොව මහජනතාවට පමණක් බව අවධාරණය කිරිම.

- නවින තාක්ෂණය ජනතා සංවර්ධනය වෙනුවෙන් සැලසුම් කිරිම.

## <u>9.3 සංවර්ධනය සඳහා සන්නිවේදන අවශ්‍යතා</u>

සංවර්ධනය සඳහා සන්නිවේදන අවශ්‍යතා යනුවෙන් හඳුන්වන්නේ

සනනිවේදන ක්‍රියාවලි හා ඔවුන්ගේම අවශ්‍යතා පිළිබඳ පූර්ණ දැනුම්වත් බවක් ලබා දිමත් වෙනස්කම් සඳහා විකල්ප ගැටලු විසදා ගැනිම සම්මුතිකව කටයුතු කිරිම ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරිම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා අත්පත් කර ගැනිම හා ආයතනික කාර්යක්ෂමතාව යනාදියෙහි ඇති වැදගත්කම පැහැදිලි කිරිමයි.



**Udaya Amaraweera, University visiting lecturer,
BA University of J'Pura, MA & M.Phil in
Mass.Com, University of Kelaniya.
Voice: 0711715342**

ලෝක මට්ටමේ ආයතන කිහිපයක් සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳව අදහස් දක්වා තිබේ.

<u>ආහාර හා කෘෂිකර්ම සංවිධානය සංවර්ධනය සඳහා සන්නිවේදනය අංශ තුනක් යටතේ විග්‍රහ කර තිබේ.</u>

- කෘෂිකර්මික නවෝත්පාදන සහ ආහාර සුරක්ෂිතතාව සඳහා ග්‍රාමීය සන්නිටවිදන පද්ධති හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරිම.
- ප්‍රජා මූලික ග්‍රාමීය ගුවන්විදුලි වැඩසටහන් කිරිම.
- ප්‍රජා පාදක ස්වභාවික සම්පත් කළමනාකරණය සහ දේශගුණික විපර්යාස වලට අනුවර්තනය විම.

<u>එක්සත් ජාතින්ගේ අධ්‍යාපන විද්‍යාව හා සංස්කෘතික සංවිධානය - ( යුනෙස්කෝ - UNESCO ) ආයතනය දක්වා ඇති අදහස්.</u>

සමාජ ගොඩනැංවිම සඳහා පුද්ගලයන් සහ ප්‍රජාවන් බල ගැන්විය හැකි සාධාරණ සුදුසු හා දැරිය හැකි ප්‍රවේශ මගින් සියලු දෙනාටම සන්නිවේදනය හා තොරතුරු ලබා දිම.

<u>යුනෙස්කෝ ආයතනය සංවර්ධනය සඳහා සන්නිවේදන මාර්ගෝපදේන මූල ධර්ම කිහිපයක් ඉදිරිපත් කර තිබේ.</u>

- වෙනස්කම් සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කරන සහභාගිත්වය ඇති කිරිම.
- ස්ත්‍රි/ පුරුෂභාවය ප්‍රමුඛ ධාරාවක් බවට පත් කිරිම
- සාධාරණත්වය විවිධත්වය සහ ඉවසිම දියුණු කිරිම.

ඉහත මාර්ගෝපදේශන ක්‍රියාත්මක කිරිම සඳහා පහත කරුණු වැදගත් බව දක්වා තිබේ.

- විවෘතව සංවාද ඇති විය හැකි නිදහස් ස්වාධින සහ බහුත්වවාදි මාධ්‍ය පද්ධතියක්.
- මහජන කථිකාව දිරිගන්වන පාරදෘශ්‍ය සහ වගකිවයුතු පාලන ක්‍රමයක්.
- විවිධ සන්නිවේදන මාධ්‍ය වලට පුළුල් මහජන ප්‍රවේශයක්

**Udaya Amaraweera, University visiting lecturer,**
**BA University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>සංවර්ධනය සදහා සන්නිවේදනය සාර්ථකව ක්‍රියාත්මකවීම සදහා පහත අංග කෙරෙහි අවධානය යොමු කිරිම වැදගත් වේ.</u>

<u>මාධ්‍ය ගුණාත්මකභාවය</u>

මාධ්‍ය ගුණාත්මකභාවය මගින් මාධ්‍ය අධ්‍යාපනය, සෞඛ්‍යය, ආපදා සහන, දූෂණය පිටු දැකිම, සුළුජන සවිබල ගැන්වීම සහ දේශීය ප්‍රජා ක්‍රියාකාරිත්වය වැනි අරමුණු ඉටුකර ගැනිමට අපේක්ෂා කෙරේ. මෙහිදි සංවර්ධනය සදහා තොරතුරු තාක්ෂණය ( ICT4D) ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම වැදගත් වේ.

මාධ්‍ය ගුණාත්මකභාවය වර්ධනය කිරිම සදහා නිදහස් සහ ස්වාධීන මාධ්‍ය වලට සහය දීම වැදගත් වේ.

<u>සහභගීත්වය හා පුද්ගලාන්තර සම්බන්ධතා ශක්තිමත් කිරිම.</u>

සහභාගිත්වය හා පුද්ගලාන්තර සම්බන්ධතා ශක්තිමත් කිරිමේ දි සාකච්ඡා සහ මැදිහත්වීම් සවිබල ගැන්වීම, පුද්ගලයන් සහ කණ්ඩායම් සවිබල ගැන්වීම, නායකත්වය හා උපදේශන කුසලතා ශක්තිමත් කිරිම සහ ස්ත්‍රී විෂමතා ප්‍රචලිතවන ප්‍රමිති හා භාවිතාවල විකල්ප ප්‍රවර්ධනය කිරිම වැදගත්වේ.

එයට අමතරව මේ යටතේ පහත කරුණු ද ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කෙරේ.

- සහභගීත්ව සන්නිවේදන වැඩසටහන් කිරිම.
- ධනාත්මක වෙනස්කම් පිළිබදව සංවේදි සංවාද මගින් ප්‍රජා සමාජිකයන්ගේ සහභාගිත්වය ඇති කිරිම.
- කාන්තාවන් හා ගැහැණු ළමයින් අතර සංස්කෘතික වශයෙන් සංවේදි වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- හැකි සෑම අවස්ථාවකදීම සහභාගිත්ව අධීක්ෂණ සහ ඇගයුම් ප්‍රවේශ ලේඛන ගත කිරිම හා ඇගයිම
- වැඩි ප්‍රජා සහභාගිත්වයක් සහිත සන්නිවේදකයන් ඇති කිරිම.

<u>අත්‍යවශ්‍ය මානුෂීය තොරතුරු සම්පාදනය</u>

මූලික මිනිස් අවශ්‍යතා සපුරා ගැනිම හා මානුෂීය ගුණධර්ම පෝෂණය මෙමගින් පැහැදිලි කෙරේ. පුද්ගලයන් සෑම දිනකම තීරණ ගන්නා අතර, අප සිතන, හා විශ්වාස කරන දේ මත පදනම්ව ජීවන ක්‍රියා සිදු කරයි.

මූලික මිනිස් අවශ්‍යතා සියල්ල පුද්ගලයෝ විවිධාකාරයෙන් සපුරා ගනිති. ආහාර, වාතය, ජලය, ලිංගිකත්වය, ආරක්ෂාව, අනන්‍යතාව පිළිබද හැගිම, සංස්කෘතිය, උරුමය, සහ වටිනාකම් වලට



Udaya Amaraweera, University visiting lecturer,
BA University of J'Pura, MA & M.Phil in
Mass.Com, University of Kelaniya.
Voice: 0711715342

ගරු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සමාජයට ලබාදිය යුතුය.මිනිස්කම හා බැඳී මිනිස් ගුණාංග වර්ධනය කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

<u>ප්‍රතිසංස්කරණ වලට මැදිහත්වීම : සහජීවන හා ගැටුම් නිරාකරණය.</u>

නව නීති හා ව්‍යවස්ථා සංශෝධන හා පුරවැසිභාවය පිළිබඳ අර්ථකථන සකස් කිරීමට මහජනයා ප්‍රතිසංස්කරණයට මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ. එමගින් ආණ්ඩුවල වගකීම නැවත අර්ථ දැක්වීමක් සිදුවේ.

එමෙන්ම රටක සිදු කරන සියලු ප්‍රතිසංස්කරණ වලට ජනයා මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ. සහජීවනය සඳහා වූ සන්නිවේදනය යනු මිත්‍ර සම්බන්ධතා යළි යළිත් තහවුරු කිරීම වේ.

සහජීවනය ආකාර කිහිපයක් සමග බැඳේ.

<u>වාර්ගික සම්බන්ධතා</u>

සමාජය පුරා එකිනෙකා අතර වාර්ගවාදත්වයෙන් තොරව සංස්කෘතික අයිතිවාසිකම් සහ අද්දැකීම් විශ්වාස හා ගෞරවය මත පදනම් වූ ධනාත්මක සබඳතා ගොඩනැගිය යුතුය.

<u>සමානාත්මතාව</u>

ජීවිතයේ සෑම අංශයකටම සමානාත්මතාවයක් තිබිය යුතුය. මිනිසා විශ්වීයව පිළිගත් ගෞරවාන්විත පුරවැසියෙක් වේ.මිනිසුන් සමානත්වය මත ස්වයං තීරණ ගත යුතුය.

<u>ආයතනික අඛණ්ඩතාව</u>

දේශපාලනික ව්‍යාපාරික සහ ප්‍රජා ව්‍යුහ විසින් ප්‍රතිසංස්කරණය වලට ක්‍රියාකාරී සහයෝගය ලබාගත යුතුය.

<u>සහජීවනය</u>

සංස්කෘතික හා උරුමය ජාතික අනන්‍යතාව වටිනාකම් වන බැවින් එහි ප්‍රතිඵලයක් ලෙස සහජීවනය පවතී.

<u>ගැටුම් නිරාකරණය</u>

පාර්ශ්ව දෙකක් හෝ ඊට වැඩි පාර්ශ්ව ගණනක් අතර පවත්නා මත භේදයට සමාකාමී විසඳුමක් ලබා ගැනීමයි. මතභේදය පෞද්ගලික මූල්‍ය දේශපාලන හෝ චිත්තවේගාත්මක විය හැකිය. සාකච්ඡා මාර්ගයෙන් ගැටුම් නිරාකරණය කිරීම වැදගත් වේ.

**Udaya Amaraweera, University visiting lecturer, BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

ගැටුම් නිරාකරණය කිරිමේදී සාර්ථකව සාකච්ඡා කිරිම සඳහා පියවර කිහිපයක් ඇත.

- ගැටුම තේරුම් ගැනිම
- ප්‍රතිපත්ති සමග සන්නිවේදනය කිරිම
- කළ හැකි යෝජනා ඉදිරිපත් කිරිම.
- හොදම විසඳුම සොයා ගැනිම.
- තෙවන පාර්ශ්විය මැදිහත්කරුවෙකු සොයා ගැනිම.
- විකල්ප සොයා ගැනිම.

**Udaya Amaraweera, University visiting lecturer,**
**BA University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

## ගෝලිය සංවර්ධනය

ගෝලිය සංවර්ධනය යනු ජාත්‍යන්තර මට්ටමේ සංවර්ධනයේ පුළුල් සංකල්පයකි. ගෝලිය සංවර්ධන වෙනස්කම් පිළිබඳ හේතු සහ ක්‍රියා පිළිබඳව සාකච්ඡා මෙන්ම තිරසර සංවර්ධනය මගින් ගෝලිය වෙනස්කම් කළමනාකරණය කිරිමේ ක්‍රමයකි.

තාක්ෂණය, නවෝත්පාදනය ආදිය ව්‍යාප්ත කිරිම, ව්‍යාපාර, සමාජය, සංස්කෘතිය, දේශපාලනය, භාණ්ඩ, සේවා සහ මිනිසුන්ගේ සංචලනය ආදියෙහි ගොලිය සංවර්ධන ව්‍යාප්තිය හා සම්බන්ධතා නිරික්ෂණය කළ හැකිය.

ගෝලිය පාරිසරික වෙනස්කම් විශ්ලේෂණය කිරිමේ දි දේශපාලනික විපර්යාස, ජෛව විවිධත්වය, කාන්තාරකරණය/පාංශු ඛාදනය, සාගර දූෂණය, මිරිදිය අඩුපාඩු සහ ජනගහණය වර්ධනය, නාගරිකරණය, පොලසි ඉන්ධන භාවිතා කිරිම පිළිබඳව විමසිය යුතුය.

## සංවර්ධන ව්‍යාපෘති

සංවර්ධනය සඳහා සංවර්ධන ව්‍යාපෘති සැලසුම්කරණය පිළිබඳ මුලික අවබෝධය මෙමගින් ඉදිරිපත් කෙරේ.

ග්‍රාමිය සංවර්ධනය සඳහා සන්නිවේදන ව්‍යාපෘති යනු දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සෞඛ්‍ය, පෝෂණය හා අනෙකුත් ප්‍රධාන සමාජිය තත්ත්ව වැඩි දියුණු කිරිමේ වඩාත් සවිමත් ක්‍රමයකි.

ප්‍රතිපත්ති සම්පාදනය සහ මානුෂිය කටයුතු පුද්ගල හැසිරිම් සහ සමාජ වෙනස්කම් ප්‍රවර්ධනය කිරිම සඳහා ක්‍රමානුකුලව සැලසුම් කළ හා සාක්ෂ්‍ය මත පදනම් වු මුලෝපායික ක්‍රියාවලියක් ලෙස සංවර්ධන වැඩසටහන් හැදින්විය හැකිය.

ළමයින් ඔවුන්ගේ පවුල් හා ප්‍රජාව සමග සාකච්ඡා කිරිම පිණිස සහභාගිත්වය භාවිතා කළ යුතුය. කෘෂිකාර්මික හා ග්‍රාමිය සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් හදුනා ගැනිම හා ඒවා සකස් කිරිම සඳහා යොමු කිරිම ද මෙමගින් අරමුණු කෙරේ.

ප්‍රදේශයේ, ගමේ ඉවත දමන දෑ පරිසර හිතකාමී ලෙස ඉවත දැමීම හෝ එකතු කර පොහොර බවට පත්කිරිම, ඒවායින් මුදල් ඉපයිම හා ලැබෙන මුදල් පාසල් සංවර්ධනයට යොදා ගැනිම පිළිබද ව්‍යාපෘතියක් කළ හැකිය.

<u>සංවර්ධනය සදහා සන්නිවේදන ව්‍යාපෘති වාර්තා අදියර</u>

- සන්නිවේදනය සදහා ආරම්භක හේතු හදුනා ගැනිම.
- සංවර්ධනය සදහා සංවර්ධන වැඩ පිළිවෙල සැලසුම් කිරිම.
- සංවරධනය සදහා සන්නිවේදන ක්‍රියාකාරකම් නියම කිරිම.
- සංවර්ධනය සදහා සන්නිවේදන දර්ශක නිර්ණය කිරිම.
- වියදම් ඇස්තමේන්තු කිරිම.

අදාල ජන කණ්ඩායම වෙත ගොස් සංවර්ධනය සදහා සන්නිවේදන ව්‍යාපෘති සැලසුම් කිරිමට අවශ්‍ය තොරතුරු ඒකරාශී කර ගැනිම වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සහ ජන කණ්ඩායම් දැනුවත් කිරිම මෙහිදි සිදුවේ.

## <u>9.4 සංවර්ධනය සදහා සන්නිවේදන අපේක්ෂා හදුනා ගැනිම.</u>

සංවර්ධනය සදහා සන්නිවේදනය අපේක්ෂා යනු සංස්කෘතිය මාධ්‍ය සන්නිවේදනය සහ සංවර්ධනය පිළිබද අන්තර් විෂය ක්ෂේත්‍රයකි.

මෙහිදි ගෝලිය හා දේශීය සන්දර්භවල සියලු සමාජීය වෙනස්කම් ගවේෂණය කෙරේ. තොරතුරු සන්නිවේදනය, අධ්‍යාපනය, හැසිරිම් වෙනස්විම, සමාජ අලෙවිකරණය, මාධ්‍ය ආචාර ධර්ම, සමාජ වෙනස්කම් සදහා සන්නිවේදනය සහ ප්‍රජා සහභාගිත්වය ආදිය මගින් ජන අපේක්ෂා ඉටු කර ගැනිමේ ක්‍රියාදාමයක් සංවර්ධනය සදහා සන්නිවේදන යන්නෙන් යෝජනා කෙරේ.

<u>අවශ්‍යතා කෙන්ද්‍රියත්වය</u>

සෞඛ්‍ය සේවා, පෝෂණය, සනිපාරක්ෂාව මානව හිමිකම් සහ නවාතැන් අවශ්‍යතා ඉටු කර ගැනිමට සංවර්ධනය සදහා සන්නිවේදනය පුළුල් ලෙස උපයෝගි කර ගැනිම අවශ්‍යතා කෙන්ද්‍රියත්වය යන්නෙන් අදහස් කෙරේ.

**Udaya Amaraweera, University visiting lecturer, BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>ස්වයං නිර්ණය</u>

ස්වයං නිර්ණය යනු තමාගේ පුද්ගල අවශ්‍යතා සම්බන්ධ ප්‍රවණතා හා මනෝවිද්‍යාත්මක අවශ්‍යතා සැලකිල්ලට ගෙන මානව අභිප්‍රේරණය සහ පෞරුෂය පිළිබඳව අවබෝධයෙන් යුතුව ක්‍රියා කිරීමයි.

ස්වයං නිර්ණය පිළිබඳ සංවර්ධන වැඩසටහනේ මනෝ විද්‍යාත්මක අර්ථකථනය නම් තමන්ගේම තෝරා ගැනීම් සහ තමන්ගේම ජීවිත පාලනය කිරීමේ හැකියාව හෝ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමයි.

<u>ස්වයං නිර්ණය සඳහා අංග කිහිපයක් අවශ්‍ය වේ.</u>

ස්වාධීනත්වය - තමන්ගේම හැසිරීම් පාලනය කිරීමට තමන් සිටින බව සිතීම කෙරෙහි මිනිසුන්ට ඇති අවශ්‍යතාව.

නිපුණතාව - තම අවශ්‍යතා දැනුම සහ කුසලතා ගොඩනැගීමට වැදගත්වන කාර්ය පිළිබඳ විශාරදත්වය වර්ධනය කිරීම ඇති අවශ්‍යතාව.

සම්බන්ධතාව - මිනිසුන්ට අනෙකෙකු සමග යම් ප්‍රමාණයක සම්බන්ධතාවයක් අත්‍යවශ්‍ය බව සිතීමට ඇති අවශ්‍යතාව.

<u>ස්වයං විශ්වාසය</u>

සංවර්ධනය පිළිබඳව පැහැදිළි විශ්වාසයක් තමා විසින්ම අවබෝධයක් ඇති ගැනීම ස්වයං විශ්වාසයයි.

තමා විසින්ම සංවර්ධන කරුණක් සම්බන්ධව අභ්‍යන්තර හේතු හෝ මුල විමසීමෙන් ඇති කර ගනු ලබන විශ්වාසයයි. දිගු කාලීන සමාජ, දේශපාලනික, ආර්ථික ආදි සංවර්ධන සහ ඵලදායිතාව පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා ස්වයං විශ්වාසය වැදගත් වේ.

මෙහිදී ඵලදායිතාව හා සංවර්ධනය සඳහා පහසුකම් සපයන බලවේග ක්‍රියා කරන්නේ කෙසේද? ස්ථාවර රාජ්‍යවල සංවර්ධන ප්‍රවණතා උදාසීන කරන යාන්ත්‍රණ මොනවාද? ප්‍රාග්ධනයෙහි සහ දැනුමෙහි බලවේග සක්‍රිය කළ හැක්කේ කෙසේද? සමාජ පද්ධති වල පවතින සැඟවුණු ආර්ථික ක්‍රමෝපාය මතු කර ගන්නේ කෙසේද? යනාදිය තමන් විසින්ම විමසනු ලබයි.

**Udaya Amaraweera, University visiting lecturer,**
**BA University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>යහපත් පරිසරයක් ගොඩනැගීම</u>

එනම් පරිසර විද්‍යාත්මක සමබරතාවයයි. පරිසරයක් ගොඩනැගීම මගින් සුහදශීලී සබදතා නිරෝගී හා ප්‍රියජනක පාරිසරික සමතුලිතතා නිරූපනය කරයි.

සියලුම ජීවින්ගේ පැවැත්මට ප්‍රමාණවත් ආහාර ලබා ගැනිම සහ ඔවුන්ගේ ස්ථාවරත්වය මගින් පාරිසරික සමතුලිතතාව ඇති බව පිළිබිඹු වේ. සියලුම ජීවින්ගේ සංහිදියාව ස්ථාවර කරන පරිසර පද්ධතියෙහි සිදු වන ප්‍රභාසංශ්ලේෂණය හොද පරිසරයක් ගොඩනැගීමට දායක වේ. මෙලෙස සියලු ම ජීවින්ගේ පැවැත්මට පාරිසරික සමතුලිතතාව හේතු කොට ගෙන සිදු කෙරේ.

සම්පත් සූරා කෑම, වනාන්තර විනාශ කිරිම වැළැක්විම වැනි මානව ක්‍රියාකාරකම් යනාදිය මෙමගින් පරික්ෂා කෙරේ. රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම හා වනාන්තර විනාශය වැළැක්විමෙන් දේශගුණික විපර්යාස වැළැකේ.

ආපදා සන්නිවේදන ක්‍රියාකාරකම් පිළිබදව මෙහිදි  අවධානය යොමු කෙරේ.

<u>සහයෝගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය</u>

මෙමගින් අපේක්ෂා කරන්නේ සංවර්ධනය සදහා සන්නිවේදනය මගින් ප්‍රජාතන්ත්‍රවාදි සවිඥානත්වය ඉහළ දැම්ම සහ ප්‍රජා සහභාගීත්වය වර්ධනය කිරිමයි.

විද්‍යුත් තාක්ෂණය භාවතා කිරිම මගින් පුරවැසි දේශපාලන ක්‍රියාකාරිත්වය දියුණු කිරිමට මෙමගින් අපේක්ෂා කරයි.

මෙහිදි සමාන අරමුණු හෝ ඉලක්ක ඇති පුද්ගලයන්ට සමාන මනසක් ඇති පුද්ගලයන් හමුවිමට හා උනන්දුවක් දක්වන ගැටලු සාකච්ඡා කිරිමට අතථ්‍ය සන්නිවේදනය යොදා ගනු ලබයි.

පැරණි මාධ්‍ය ධූරාවලියේ ප්‍රකාශනය සදහා වූ බාධක වළකා අතථ්‍ය සන්නිවේදනය මගින් ප්‍රජාතන්ත්‍රවාදි ප්‍රජා සහභාගිත්වය වැඩි දියුණු කෙරේ. මෙමගින් පුරවැසියන්ට ඔවුන්ගේ දේශපාලන නියෝජිතයන් සමග කථා කළ හැකිය.

ජනයා අතර අන්තර් ක්‍රියාකාරිත්වය නිරන්තරයෙන් පවත්වා ගෙන යනු ලබන සන්නිවේදන සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදයයි.

මෙසේ සන්නිවේදන බලයෙන් පුරවැසියෝ වඩාත් ඍජු සංවර්ධන භූමිකාවක් ඉටු කිරිම පිණිස දිරි ගැන්වෙති.

**Udaya Amaraweera, University visiting lecturer,**
**BA University of J'Pura, MA & M.Phil in**
**Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**